දිඹුලාගල ප්‍රාදේශීය සභාව
--------------------------------
පොළොන්නරුව දිස්ත්‍රික්කය
-----------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැඩ නිමකර තිබුණු නව ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැඟිල්ලේ ප්‍රාග්ධන පිරිවැය සහ ඉකුත් වර්ෂයේ වැඩ නිමකර තිබුණු රු. 5,140,857 ක් වූ විජයබාහුපුර ආදාහනාගාරයේ ප්‍රග්ධන පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභාවට අයත් මෛත්‍රී ක්‍රීඩා පිටිය, සති පොළ භූමි 02 ක් හා සුසාන භූමි 50 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ ගරාජය ඉදි කිරීමට දරා තිබුණු රු. 1,649,384 ක් හා අරලගංවිල පොළ භූමිය වටා කම්බි වැටක් හා ආරක්ෂිත ගේට්ටු සවි කිරීමට දරා තිබුණු රු. 5,065,504 ක ප්‍රග්ධන වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) 2008 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලබාදී තිබුණු රු. 541,000 ක් වටිනාකමැති සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටලය සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 14 දින මින්නේරිය යුධ හමුදා යුධෝපකරණ බලකාය වෙත ලබාදී තිබුණද එහි වටිනාකම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු. 74,500 ක් වටිනා ඇහිලි සළකුණු යන්ත්‍රය හා රු. 60,925 ක් වටිනා ඇමතුම් උපකරණ පද්ධතියට අදාල වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ වැටුප් ප්‍රතිපූර්ණය වෙනුවෙන් රු. 2,471,241 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණද එම මුදල තවදුරටත් ණයගැතියන් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ තොගය රු. 247,695 ක් වුවද, එය රු. 168,910 ක් ලෙස රු. 78,785 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2013 වර්ෂයේදී පුනරාවර්ථන වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණු මනම්පිටිය සතිපොල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වැය වූ රු.1,543,510 ක මුදල සමාලෝචිත වර්ෂය තුලදීද නිවැරදි කර නොතිබුණි.

(එ) සභාව සතු මනම්පිටිය හා නුවරගල පුස්තකාල සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පොත්වල වටිනාකම රු. 193,515 ක් වුවද, එය රු. 213,360 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් රු 19,845 ක් වැඩියෙන් ගිණුම්වලදක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ විවිධ ප්‍රතිපාදන මත ඉටුකර තිබුණු සංවර්ධන ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් ලැබිය යුතු රු. 7,272,878 ක මුදල් හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු රු. 7,272,878 ක් කර්මාන්ත ණයගැතියන් හා කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ මූලධන ආදායම් ලෙස දක්වා තිබුණු රු. 5,640,443 ක මුදල තුල ඉකුත් වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාලව ලැබුණු රු. 3,984,405 ක්ද ඇතුලත්ව තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ඉකුත් වර්ෂවල කඩා ඉවත් කර තිබුණු ඇල්ලේවැව සති පොළ ජල ටැංකියේ වටිනාකම රු. 178,845 ක් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 ක ශේෂයන්ගේ වටිනාකම් හා ඊට අදාල උපලේඛන වල දැක්වෙන ශේෂයන්ගේ වටිනාකම් අතර රු. 3,453,538 ක වෙනසක් පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 157,538,297 ක්වූ ගිණුම් ශේෂ 10 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 4 කට හා 7 කට අධික කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබෙන එකතුව රු. 1,000,023 ක පොළ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කර්මාන්ත ණයහිමි ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 4,406,384 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 අනුකූල නොවීම්

--------------------

නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත | - | පරිසර බලපත්‍ර ලබාගැනීමකින් තොරව ක්‍රියාත්මක ආයතන 48 කට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | රීති අංක 59 සිට 63 දක්වා | - | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) | 119 වන රීතියේ සිට 121 වන රීතිය දක්වා | | සති පොළ බදුදීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි. |
| (iii) | 180 රීතිය | | දේපල, මුදල්, මුද්දර ආදියෙහි භාරකාරිත්වය දරණ කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| (iv) | 197 රීතිය | | ගබඩාභාරකරුගේ වාර්තාවල හා ලේඛනවල සටහන්හි නිවැරදිතාවය පරීක්ෂා කර බලා නිවැරදි බවට ලේකම්වරයා විසින් සහතික කර නොතිබුණි. |
| (v) | 203 රීතිය | | සභාව සතු වාහන 23 ක් සම්බන්ධව වසර ගණනාවක සිට වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (vi) | 212 රීතිය | | මිලදී ගත් සියළුම භාණ්ඩ බඩු වට්ටෝරු පොත්වල සටහන් කළ යුතු වුවද, විදුලි භාණ්ඩ හා අනෙකුත් භාණ්ඩ අයිතම 17 ක් තොග පොත් ශේෂය හා භෞතික ශේෂය අතර ඒකක 631 ක වෙනසක් පැවතුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මු.රෙ. 177(1) | | ක්ෂේත්‍ර නිලධාරින් විසින් එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතා ප්‍රේෂණය කළයුතු වුවද ආදායම් පරීක්ෂකවරුවිසින් ක්ෂේත්‍රයේදී එකතු කරනු ලබන මුදල් |

| | | | |
|---|---|---|---|
| | | | කාර්යාලයට බැඳීමට  දින 03 සිට දින 19 දක්වා කාලයක් ගතකර තිබුණි. |
| (ii) | මු.රෙ. 343 | | උප පත්‍රිකා පොත් පෝරම නැතිවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) | මු.රෙ. 396 | 37,497 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවූ චෙක්පත් 8 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 802(3) | | වාහන පිළිබඳ මිලට ගත් දිනය, අළුත්වැඩියා වියදම, නිශ්ක්‍රීයව පැවති කාලය ආදී තොරතුරු පවත්වාගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අයිජ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | සභාව සතු පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | |
| (i) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | | සභාව සතු කඩ කාමර තක්සේරු කර නොතිබුණ අතර, 1992 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත පදනම්ව කුලී අයකර තිබුණි. |
| (ii) | 2015 දෙසැම්බර් 04 දිනැති අංක NCP/ LG/AC/04/01/02 දරන  ලිපිය | 209,095 | අනුමත ඉන්ධන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසවල ඩීසල් ලීටර් 2201 ක් භාවිතා කර තිබුණි. |
| (ඊ) | 2012 ජූලි 22 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය - 25 | 40,500 | මිලියන 2 ට වැඩි ප්‍රසම්පාදන රැස්වීම වෙනුවෙන් දීමනා ලබාගත හැකි වුවද, ඊට අඩු මිලදී ගැනීම් සඳහා ටෙන්ඩර් මණ්ඩල දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ අවස්ථා 12 කදී ගෙවීම් කර තිබුණි |

## 02 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,190,619 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන ආදායම ඉක්මවූ වියදම රු. 12,233,446 ක් විය

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | 2017 | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 17,070,200 | 22,580,761 | 21,187,110 | 8,446,840 | 25,866,000 | 17,605,708 | 16,241,253 | 7,053,118 |
| (ii) | කුලී | 9,509,256 | 3,633,389 | 3,519,609 | 1,383,203 | 13,938,656 | 3,761,892 | 3,818,999 | 837,174 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,792,000 | 2,783,037 | 2,793,477 | 2,065,779 | 5,513,000 | 2,310,283 | 2,326,568 | 1,438,570 |
| (iv) | වෙනත් ආදායම් | 8,109,400 | 10,984,334 | 3,970,325 | 13,660,545 | 79,354,000 | 11,310,036 | 8,979,256 | 6,646,487 |
| | | 37,480,856 | 39,981,521 | 31,470,521 | 25,556,367 | 124,671,656 | 34,987,919 | 31,366,076 | 15,975,349 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු ආදායම රු. 37,480,856 ක් වූ නමුත් රැස්කල ආදායම රු. 31,470,521 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු. 25,556,367 ක් විය.

#### 2.2.3 බදුකුලී

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කඩ කාමර 17 ක් සඳහා බදුකරුවන් සමඟ වලංගු ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) කඩ කාමර බදු දීමේදී වලංගු ගිවිසුම්වලට එළඹ නොතිබීම මත අයකර ගත යුතු කුලී අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට කඩ කාමර 11 කින් අයවිය යුතු කුලිය රු. 246,020 ක් විය.

(ඇ) සභාව සතු අරලගංවිල සතිපොළ බදුදීම සඳහා ප්‍රාදේශීය සභාව හා බදු ගැණුම්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම් අනුව සියලුම මුදල් 2017 මැයි 31 දිනට පෙර ගෙවා නිමකළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් රු. 137,160 ක් හිඟවතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-------------------

සභාව මඟින් ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති 04 හි හිඟ ජල ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 7,371,366 ක්විය.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 12,904,995ක් හා මුද්දර ගාස්තුරු. 755,500 ක්විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 කාර්යසාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාල ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණු ග්‍රාම සේවා වසම් 14 ක මාර්ග කි.මී. 53.5 ක් සංවර්ධනය නොකර වෙනත් මාර්ග සංවර්ධනය කර තිබුණි.

(ආ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටුකිරීම සඳහා අවශ්‍යඅතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර පළාත පාලන විෂය - භාර අමාත්‍යවරයා විසින් පනවා තිබුණ අතුරු ව්‍යවස්ථා ද අනුගමනය කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

අතුරුව්‍යවස්ථා හඳුනාගෙන නොතිබීම මතසභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

(i) දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කසළ බැහැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අරලගංවිල දඹගහ උල්පත ප්‍රදේශයේ අක්කර 05 ක ඉඩමක් 2012 වර්ෂයේදී ලබාදී තිබූ නමුත්, එම ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ii) සභාව විසින් දෛනිකව එකතු වන ටොන් 7.5 කට අධික කසළ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව විවෘත භූමියකට බැහැර කර තිබුණි.

(iii) 2016 වර්ෂයේදී කසළ අපහරණ ව්‍යාපෘති වාර්තාවක් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එවැනි ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

(iv) 2014 අප්‍රේල් 20 දිනැති අංක 2015/33 දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත මහජන ආරක්ෂණ පනතේ 42 අධිකාරිය යටතේ කැලි කසළ ඉවත් කිරීම, එක්රැස් කිරීම, තාවකාලිකව ගබඩා කිරීම, පිරිසැකසුම, වෙන් කිරීම, පිළියම් යෙදීම, බැහැර කිරීම හා විකිණීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් විසින්

ඉටුකළ යුතු අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්කර තිබුණද ඒ සඳහා සභාවේ ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව කිසිදු දැනුවත්භාවයක් නොතිබුණු අතර එම නිසා ඉදිරි සූදානම්වීම සඳහා,

(i) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම

(ii) ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගැනීම

(iii) ඉහත කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කිරීම හා අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනාගැනීම

(iv) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් (Stake Holders) හඳුනාගැනීම

(v) හඳුනාගත් අරමුණු ඉලක්ක මැනීම සඳහා පාදක දත්ත හඳුනාගැනීම, රැස් කිරීම හා ගබඩා කිරීම යන කිසිදු ක්‍රියාකරකමක් 2018 මැයි 02 දින වන විටද සිදුකර නොතිබුණි.

3.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය, ගල්රෝල, බවුසරය හා ගලි බවුසරය කුලියට දීමෙන් රු. 1,356,430 ක ආදායමක් උපයා තිබුණද ඒ සම්බන්ධයෙන් වාහන කුලී ආදායම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉන්වෙන්ට්‍රි ගත නොකළ අයිතම 240 ක් 2017 දෙසැම්බර් 11 දින වන විටද ලේඛනගත කර නොතිබුණි.

(ඇ) පාවිච්චි කර අවසන් වී නැවත සභාව වෙත භාරනොදුන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු ක්ෂේත්‍ර ආදායම් බිල්පොත් හා ලදුපොත් 21 ක් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවට අයත් වාහන 03 ක් සඳහා රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව ස්ථාන මාරු වීම් ලබා නොදී එකම ජල ව්‍යාපෘතියක වසර 06 සිට වසර 10 දක්වා කාලයක් සේවකයින් අනුයුක්ත කර තිබුණි.

(ඊ) ඍජු ශ්‍රමය යටතේ වාහන නවතා තැබීමේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මිලදී ගන්නා ලද රු. 1,518,628 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ ලේඛනගත නොකර නිකුත් කර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ද්විතියික මට්ටමට අයත් තනතුරු 11ක, හා ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 07 ක පුරප්පාඩු පැවති අතර, ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 12 ක අතිරික්තතා පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ අනියම් හා තාවකාලික පදනම මත සේවකයින් 16 ක් බඳවගෙන තිබුණි.

(ආ) දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ස්ථිර පත්වීම් ලබා වසර 6 සිට වසර 8 දක්වා කාලයක් ගතවී තිබුණු සේවකයින් 06 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ලබා තිබුණු සේවකයින් 05 දෙනෙකුගේ සේවක ණය රු. 320,594 ක් අයකරගෙන නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව සතු වත්කම් අයිතම 10 ක් බදුදීමේදී පුවත්පත් දැන්වීම් පලකර ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම් කර නොතිබුණි.

(ආ) සභාවට මිලදී ගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් ලැබීම් හා නිකුත් කිරීම් නියෝග භාවිතා කර නොතිබුණි.

(ඇ) ජල ව්‍යාපෘති සඳහා නළ එළීමේ පවතින දුර්වලතා හේතුවෙන් කෙලවරෙහි පිහිටි ගම්මාන වලට අඛණ්ඩව හා ප්‍රමාණවත්ව ජලය නොලැබෙන බවට පාරිභෝගික පැමිණිලි පැවතුණි. සභාව මඟින් ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති වලින් ජලය ලබාගැනීමට නව ජල සම්බන්ධතා ඉල්ලීම් 270 කට අධික ප්‍රමාණයක් ලැබී තිබුණද ඒ සඳහා නව ජල සම්බන්ධතා ලබාදීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ රු. 8,179,425 ක් වැයකර 2015 වර්ෂයේ ඉදිකර තිබූන සිරිපුර ජල ව්‍යාපෘතියේ ජල ටැංකිය නිසි ප්‍රමිතියෙන් ඉදි නොකිරීම මත ටැංකියේ පෙරණය සවි වන කොන්ක්‍රීට් තට්ටුව 2018 පෙබරවාරි මස කඩා වැටීම නිසා වැලි පෙරණය සහිත ටැංකිය භාවිතයට නොගෙන අතහැර දමා තිබුණි. එම ව්‍යාපාතියට අලුතින් සවිකර තිබූ මෝටරයේ නන්රිටන් වැල්වය අක්‍රිය වීම නිසා භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ඉ) සභාව සතු දිඹුලාගල, වෙහෙරගල හා සිරිපුර ජල ව්‍යාපෘතීන්හි ජලය පිරිපහදු කිරීමේදී මණ්ඩි බැස්ම පියවර අනුගමනය නොකර දෛනිකව විරංජන කුඩු මිශ්‍ර කිරීම පමණක් සිදුකරමින් පැවතුණි. ව්‍යාපෘති වල වැලි පෙරණයන්හි වසර 30 කට පමණ පෙර දමන ලද වැලි තට්ටු සම්පූර්ණයෙන්ම ඉවත් කර අළුතින් වැලි තට්ටු නොයෙදීම නිසා ජල පිරිපහදු ක්‍රියාවලිය අසාර්ථක වී තිබුණි.

3.5 වත්කම් කළමනාරණය

---------------------------

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

(i) සභාව සතු වටිනාකම රු. 2,087,037 ක් වූ ගොඩනැගිලි 06 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ii) නුවරගල, වෙහෙරගල හා සිරිපුර ජල ව්‍යාපෘතිවලට ලබාදී තිබුණු ක්ලෝරින්කරණ යාන්ත්‍රික පද්ධතිය ක්‍රියාවිරහිතව පැවතුණි.

(iii) ග්‍රාමීය මාර්ග නියමු ව්‍යාපෘතිය මඟින් මාර්ග නඩත්තු කිරීම සඳහා 2014 ජනවාරි 20 දින ලබාදී තිබුණු රු. 243,750 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2018 අප්‍රේල් 29 දින වන විටත් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදාගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-------------------------------------------

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන )රීති මාලාවේ 214 රීතිය ප්‍රකාරව සභාවේ දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, 2017 වර්ෂය සඳහා වූ සමීක්ෂණය 2018 අප්‍රේල් මාසය වන විටත් සිදුකර නොතිබුණි. එමෙන්ම වර්ෂ ගණනාවක සිට සභාවට අයත් පුස්තකාල 02 හි පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් ද සිදුකර නොතිබුණි.

(ii) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය ප්‍රකාරව සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණයකට ලක්කල යුතු වුවත්, සභාව විසින් එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශ්වයන්ට ලබාදී ඇති වත්කම්

----------------------------------------

සභාව සතු වටිනාකම රු. 127,032 ක් වූ වෙහෙරගල ළදරු පාසල් ගොඩනැඟිල්ලේ බාහිර පාර්ශවයක් විසින් ළදරු පාසලක් පවත්වාගෙන යන අතර ඒ සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද ගොඩනැඟිල්ලෙන් මාසික කුලියක් අයකර ගැනිමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

--------------------------------------------------------------------

සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් කිසිවකට හිමිකම් ඔප්පු හෝ පැවරීම් සහතික ලබාගෙන නොතිබුණි.

3.6 අවිධිමත් ගණුදෙණු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 ජූලි 24 දිනැති අංක 20/2002 දරන පළාත් පාලන ආයතන චක්‍රලේඛ අනුව විථි රේඛා හෝ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු පැහැදිලිව ගැසට් කිරීමෙන් තොරව ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගී වන නිලධාරීන් විසින් අයකරනු ලබන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 50 ක් ඔවුන් වෙත ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ එලෙස ගෙවූ දීමනාව රු. 40,875 ක් විය.

(ආ) ටෙන්ඩර් මණ්ඩල දීමනා ලබා ගැනීම සඳහා කාර්යාල වේලාවෙන් පරිබාහිරව රැස්වීම් පැවැත්විය යුතු වුවද, කාර්යාල වේලාවන් තුල පැවැත්වූ ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 12 කදී රු. 40,500 ක ටෙන්ඩර් මණ්ඩල දීමනා ගෙවා තිබුණි.

3.7 හඳුනාගත් පාඩු

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක DDD/HO/3/ACC/LG දරන 2014 නොවැම්බර් 17 දිනැති දිවිනැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව මහජන උපයෝගීතාවයන් සඳහා 2014 වර්ෂයේ සභාවට ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 360 ක් සභාවේ හිටපු සභාපති හා මන්ත්‍රීවරුන් 06 දෙනෙකුට නිකුත් කර වසර 03 ක් ගතවී තිබුණද, ඒවා ආපසු භාරගෙන නොතිබුණි

(ආ) 2015 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු. 1,299,880 ක් වටිනා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 10 ක් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත නිකුත් කර තිබුණු අතර, සභාව විසුරුවා හැර වසර 2 1/2 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ඒවා ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මනම්පිටිය මහජන පුස්තකාලයේ පුස්තකාලාධිපති විසින් 2015 ඔක්තෝබර් 10 දින පුස්තකාලය භාර දීමේදී පුස්තකාල පොත් 2,246 ක ඌනතාවයක් පැවති අතර, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි

(ඈ) වෙහෙරගල,සිරිපුර හා නුවරගල ජල ව්‍යාපෘතිවල පාරිභෝගික ජල මනු 1077 ක් මාස 1 සිට මාස 12 දක්වා කාලයක් තිස්සේ අක්‍රියව පැවති අතර ජල පාරිභෝගිකයින්ගෙන් මාසිකව දළ ගාස්තුවක් පමණක් අයකිරීම මත පාරිභෝජනය කරන ලද ජල ප්‍රමාණයට ගාස්තු අය නොවීමෙන් දිගින දිගටම ජල ව්‍යාපෘති පාඩු ලබන තත්ත්වයකට පත්ව තිබුණි.

3.8 දෘෂ්‍ය අක්‍රමිකතා

-------------------

2016 ජුනි සිට 2017 ජුනි දක්වා කාලය තුල ජල ව්‍යාපෘති කාර්යාල වලින් ප්‍රාදේශීය සභාව වෙත ප්‍රේෂණය කර තිබුණු රු. 5,444,137 ක මුදලින් රු. 2,625,660 ක් හා සිරිපුර ජල ව්‍යාපෘතියේ රු. 16,720 ක මුදල්

සම්බන්ධයෙන් මූලා අක්‍රමිකතාවයන් සිදුවී තිබුණි. ඒ සම්බන්ධයෙන් 2018 අප්‍රේල් 28 දින දක්වා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.9 ප්‍රසම්පදානය

---------------

3.9.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා රු. 6,965,702 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණත් ඒ සඳහා ප්‍රසම්පදාන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.9.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ වාහන නවතා තැබීමේ ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් සභාවේ තාක්ෂණ සහායක නිලධාරී විසින් සකස් කර තිබූ රු. 3,539,156 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුවට ඉංජිනේරු අනුමැතිය හා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 20 ක් සම්බන්ධයෙන් වියදම් ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන නොතිබුණි.

(ඇ) අරලගංවිල සති පොළ භූමියේ කඩ කාමර 12 ක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදි රු. 11,579,412 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර කඩ කාමර 5 ක් සඳහා අත්තිවාරම් යොදා කොන්ක්‍රීට් කණු ඉදිකිරීම වෙනුවෙන් රු. 939,167 ක් වැයකර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල කඩකාමර ඉදිකර නොතිබුණි.

**04. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**---------------------------------------**

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයේ ගණුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.2 විගණන හා කළමනාරකණ කමිටු

-------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කාලානුරූපීව රැස්වීම් පවත්වා නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

2017 පළාත් මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ අනුමත ව්‍යාපෘති සඳහා රු. 4,010,000 ක මුදලක් වෙන්කර තිබුණු නමුත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා වැයකර තිබුණේ රු. 1,832,810 ක් පමණක් වූයෙන් ඒ සඳහා වෙන්කළ රු. 2,177,690 ක මුදලක් ඉතිරි වී තිබුණි.

**05. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | වත්කම් ඌන උපයෝජිතව පැවතීම |
| | | (ii) | වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම |
| | | (iii) | වත්කම් අයිතිය පවරා නොගැනීම |
| (ආ) | ගිණුම්කරණය | | විධිමත් පරිදි පොත්පත්, ලේඛන හා වාර්තා යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අය නොකිරීම |
| | | (ii) | බදු ගිවිසුම් විධිමත් නොකිරීම |
| | | (iii) | අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු නොකිරීම |
| (ඇ) | ණයගැති/ණයහිමි පාලනය | (i) | නිවැරදිව ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | ණයගැතියන් හා ණයහිමියන් නිරවුල් නොකිරීම. |
| (ඉ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම |
| | | (ii) | විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම |